

LANKACOAL
COMPANY(PVT)LTD

වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
Annual Report 2021

ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම
வரையறுக்கப்பட்ட இலங்கை நிலக்கரி (தனியார்) நிறுவனம்
Lanka Coal Company (Pvt) Ltd.

ස්ථාපිත කිරීම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2006 වර්ෂයේ දී
අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මත
2008 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර
2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි.

දැක්ම

ශ්‍රී ලංකාව තුළ අබණ්ඩව බලශක්තිය සැපයීමට සහතික කරනු පිණිස ශ්‍රී ලංකාව
තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා
ගල්අඟුරු අවශ්‍ය ගුණාත්මක භාවයෙන් සහ ප්‍රමාණයෙන්, කාර්යක්ෂමව සහ
ක්‍රියාශීලීව අවම පිරිවැයකින් ප්‍රසම්පාදනය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා
ගල්අඟුරු අවශ්‍ය ප්‍රමාණයෙන් සාධාරණ මිළකට ප්‍රසම්පාදනය කිරීම.
ගල්අඟුරු අළු භාවිතා කොට නව නිෂ්පාදන හඳුන්වා දෙමින්
පරිසර හිතකාමී ගල්අඟුරු අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධති ක්‍රියාත්මක කිරීම.
කර්මාන්තකරුවන්ගේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකයද වඩාත් ශක්තිමත් කිරීමේ
විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙස ඔවුන් වෙත ගල්අඟුරු හඳුන්වාදීම.

පටුන

ආයතනික තොරතුරු	04
සභාපතිතුමාගේ පණිවිඩය	05
පාලනය	06
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	08
අවධානම් කළමනාකරණය	10
කාර්යසාධන සමාලෝචනය	12
අනාගත උපායමාර්ගික සැලසුම්	18
විගණකාධිපති වාර්තාව	20
විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා ලංකා ගල්අඟුරු සමාගමේ නිරීක්ෂණ	26
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය	32
මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය	34
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	35
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	36
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	38

ආයතනික තොරතුරු

සමාගමේ නම	:	සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
සමාගම ලියාපදිංචි කිරීමේ අංකය	:	පීවී 62636
නෛතික ආකාරය	:	2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මගින් ස්ථාපනය කරන ලද පූර්ණ වශයෙන් රජය සතු ව්‍යාපාර කළමනාකරණය කරනු ලබන සමාගමකි.
ලියාපදිංචි කාර්යාලය	:	අංක 51/13, සුරනිමල පෙදෙස, Off Dutugemunu Street, කොහුවල, දෙහිවල, ශ්‍රී ලංකාව. දු.ක. +9411 2824681/2 ෆැක්ස් +94112824689 විද්‍යුත් තැපෑල consec@lankacoal.lk වෙබ් අඩවිය www.lankacoal.lk
පරිපාලක සමාගම	:	ලංකා විදුලිබල මණ්ඩලය අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
සමාගම් ලේකම්වරු	:	සීමාසහිත පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම අංක 3/17, කිංසි පාර, කොළඹ 08.
විගණකවරු	:	විගණකාධිපති ජාතික විගණන කාර්යාලය, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.
බැංකුකරුවෝ	:	මහජන බැංකුව - ආයතනික ශාඛාව ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව - හයිඩ් පාර්ක්

සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය

2021 න් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටට පත්වෙමු. ලංකා ගල්අඟුරු සමාගමේ සභාපති ලෙස මම 2020 වර්ෂයේ සිට කටයුතු කරමි. එතැන් සිට මේ දක්වා ලංකා ගල්අඟුරු සමාගමේ පැවැති අවිධිමත් ක්‍රම විධිමත් කිරීමට ගරු අමාත්‍යතුමාගේ මෙන්ම ලේකම්තුමාගේ මගපෙන්වීම යටතේ මට හැකිවූ අතර, එමගින් විශාල ප්‍රගතියක් අත්පත් කරගැනීමටත්, සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් නායකත්වයක් ලබාදීමටත් හැකිවූ බව මම සතුටින් අවධාරණය කරමි.

ලංකා ගල්අඟුරු සමාගම 2008 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබුවේ මෙ.වො. 900 ක ධාරිතාවකින් යුත් දිවයිනේ මූලික බලශක්ති මූලාශ්‍රය වන නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය මගින් ජාතික බලශක්ති ජාලය වෙත අඛණ්ඩ ගල්අඟුරු සැපයීමට සහතික කරනු පිණිසය. එයට මෙ.වො. 300 ක ධාරිතාවකින් යුත් බලාගාර තුනක් ඇත. එබැවින් අවශ්‍ය ප්‍රමාණයෙන් ගල්අඟුරු කලට වේලාවට සැපයීම විශාල වගකීමක් වන අතර එසේ නොවුනහොත් එමගින් ජාතික ආර්ථිකයට මෙන්ම ජනතාවගේ එදිනෙදා ජීවිතයට සුවිශේෂී බලපෑමක් ඇතිවිය හැකිය.

එබැවින් ලංකා ගල්අඟුරු සමාගම විසින් සිදුකරනු ලබන ජාතික මෙහෙවරට නායකත්වය ලබාදෙමින් සහ මෙම භාරදූර වගකීමට උරදීමට හැකිවීම එහි සභාපති වශයෙන් මා ලද වරප්‍රසාදයක් ලෙස මම සලකමි. එසේම ගල්අඟුරු සමාගම ස්ථාපනය කළ දින සිට දශකයකට වැඩි කාලයක් තිස්සේ අක්‍රියව නොපැවති අනුගමනය කරන ක්‍රියාකාරකම් අනුකූලනය කිරීමට අනුගමනය කළ යුතු සම්මත ක්‍රමවේද ස්ථාපනය කිරීම මාගේ වෘත්තීය ජීවිතයේ සන්ධිස්ථානයයි.

ඒ අනුව, අසම්පූර්ණ වාර්ෂික වාර්තා සම්පූර්ණ කොට අනුමැතිය සඳහා විදුලිබල අමාත්‍යාංශය මගින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීය. ඒවායේ බොහෝ දුරට අනුකූලනය කිරීම් සාර්ථක වී ඇත. ලංකා ගල්අඟුරු සමාගමේ ප්‍රධාන කාර්යය වන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම, ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ලංකා විදුලිබල මණ්ඩලයේ අනුමැතියට යටත්ව කාර්යමණ්ඩලයට වැටුප් ගෙවීමේ සම්මත ක්‍රමයක් ස්ථාපනය කිරීම, ලංකා ගල්අඟුරු සමාගම සහ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද සේවකයින් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ සහ ආයතනික ණය සහන සඳහා සම්මත ක්‍රියාපටිපාටියක් සකස් කිරීම, සියලුම ලංසු ලේඛන සහ ගිවිසුම් සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් නෛතික අනුමැතිය ලබාගැනීම, ප්‍රසම්පාදන කැඳවීමට පෙර මූලික සැලසුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ප්‍රසම්පාදන අත්පොත සහ අභ්‍යන්තර පාලන මාර්ගෝපදේශ නීති සංග්‍රහය වැනි ක්ෂේත්‍රවල සම්මත ක්‍රියාපටිපාටීන් හඳුන්වාදීම සහ අනුකූලනයවීම ආදිය ඒ අතර ප්‍රධාන වේ.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සංකල්පයට අනුගතව බහුතර පිරිසකගේ සහයෝගය ඇතිව අක්‍රීය සහ අභාවයට ගොස් තිබූ සමහර යහපාලන ක්‍රියාවලි කිහිපයක් විධිමත් කිරීමට සම්පූර්ණ දායකත්වය ලබාදීමට ලංකා ගල්අඟුරු සමාගමේ පසුගිය වර්ෂයේ සභාපති වශයෙන් මට හැකිවිය.

මෙම අරමුණු විවිධ මාර්ගවලින් සාක්ෂාත් කරගැනීමේදී මා හට උපකාර කළ ගරු අමාත්‍යතුමාට, අමාත්‍යාංශ ලේකම්තුමාට, ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට, මූල්‍ය කළමනාකාරතුමාට, ප්‍රසම්පාදන කළමනාකාරතුමාට සහ කාර්ය මණ්ඩලයේ අනිකුත් සියලුමදෙනාට මාගේ කෘතඥතාවය පලකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

සංයුක්ත පාලනය

"සංයුක්ත පාලනය" යනු අයිතිවාසිකම් හා වගකීම් යටත් වන නීති, ක්‍රියාවලි හෝ රෙගුලාසිවලට අනුව ඒවා විවිධ සංස්ථාපිත ආයතන අතර බෙදාහරිනු ලබන ක්‍රම විස්තර කරන සාමාන්‍ය පදයකි. භාවිතයේදී, සංයුක්ත පාලනය යනු හිමිකරුවන් සෘජුව හෝ වක්‍රව තීරණ ගැනීමේ පද්ධතිය සහ සමාගම පාලනය කරන ව්‍යුහය අර්ථ දක්වනු ලැබේ. ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ සියලුම ක්‍රියාකාරකම්වල ව්‍යාපාරික අවංකභාවය සහ වෘත්තීය දක්ෂතාවය සුරක්ෂිත කිරීම වෙනුවෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. මෙම කැපවීමේ කොටසක් ලෙස, විනිවිදභාවය, පාලනය සහ වගවීම අවධාරණය කරන පොදුවේ පිළිගත් ප්‍රතිපත්ති වැඩරාමුවක් පදනම් කරගෙන සමාගම තුළ යහ පාලන පරිචයන් පූර්වක්‍රියාකාරිව උද්යෝගීමත් කිරීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

කොටස්කරුවන්, රජය සහ විය මෙහෙයවන සමාජය වෙනුවෙන් තමන්ගේ වගකීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටින අතර සමාගමේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාමේදී ආචාරධර්මීය පවැත්මක් ඉසිලීමට ඉතා පැහැදිළිව කැපවී සිටී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂවරුන් පත්කිරීම	අධ්‍යක්ෂවරුන්ගේ නම
ගරු අමාත්‍යතුමා විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු	(1) සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ (2)අධ්‍යක්ෂක
විදුලිබල මණ්ඩලය විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු	(1)සාමාන්‍යාධිකාරී – අධ්‍යක්ෂක (2)ඒ.ජී.එම්. (ජනනය) – අධ්‍යක්ෂක
භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක
ලංකා නැව් සංස්ථාවෙන් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක (සභාපති)
වරාය අධිකාරියෙන් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක
එකතුව	අධ්‍යක්ෂ මණ්ඩලය 7
විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද නිරීක්ෂකයෙක්	අතිරේක ලේකම් - විදුලිබල අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය

2021 දෙසැම්බර් 31 දිනට නිලය දැරූ සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ නම්

- **බි.කේ.ජේ.කේ. පෙරේරා මහතා (සභාපති)**
- **ඉංජිනේරු එම්.ආර්. රනතුංග**
- **එස්.ඩබ්ලිව්. මදනායක මහතා**
- **ඩබ්ලිව්.එස්. වීරමන් මහතා**
- **ඒ.ආර්. නවමනි මහතා**
- **ආචාර්ය ඩී.පී.එම්.ටී. ජයමාන්න**

වර්ෂය තුළදී සමාගම සමග කිසිඳු සෘජු හෝ වක්‍ර ගිවිසුමකට එළඹීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇල්මක් නොතිබුණි. එකී කාලපරිච්ඡේදය සඳහා සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙන එකිනෙක මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ සඳහා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා ස්ථාවරව සහ සාධාරණව අදාල කරගෙන ඇති අතර දූරදර්ශී විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදුකර ඇත. අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල විස්තර කර ඇත.

සෑමවිටම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට යුක්තිසහගත ක්‍රියාමාර්ග ගනු ලබන බවට සහතික

සංයුක්ත පාලනය

කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවය යුතු ය. මෙම සංදර්භය තුළ, වංචා සහ අනිකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ සොයා ගැනීම පිණිස ඔවුන් විසින් යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කර ඇත.

ගිණුම් පිළියෙල කිරීමේදී අඛණ්ඩභාවය යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. සමාගමේ අයවැය සහ ණය ගැනීමේ පහසුකම් සමාලෝචනය කිරීමෙන් පසුව සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකරගෙන යාම පිණිස ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලද දිනයන්

1) 2021.01.11
2) 2021.02.25
3) 2021.03.29
4) 2021.04.30
5) 2021.05.31
6) 2021.06.28
7) 2021.07.30
8) 2021.08.30
9) 2021.09.29
10) 2021.10.28
11) 2021.11.29
12) 2021.12.29

මූල්‍ය සහ මෙහෙයුම් යන විගණනයන් දෙකටම පසුව නිකුත් කරනු ලබන විගණකාධිපතිගේ වාර්තාවේ අභිතකර සටහන් අන්තර්ගතව තිබුණි. අපි මෙහෙයුම් පිළිබඳව කතා කළොත්, ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය, සැපයුම්කරුවන් සඳහා සිදුකරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් කිසිඳු උනන්දුවක් නොමැති කළමනාකරණ පාලනය, තත්ත්ව පාලන/තත්ත්ව මිල ගැලපීම්, විනිවිදභාවය සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් අසාර්ථක ලංසුකරුවන් විසින් නිතර නිතර ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග ආදිය සඳහා සමාගමට වැඩි වශයෙන් කටයුතු කිරීමට සිදුව තිබූ ගැටළු ය. මෙම කරුණුවලින් බොහෝමයක් විගණන වාර්තාවල ඉස්මතු කර පෙන්වා තිබුණි. කෙසේ වෙතත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය විශාල ප්‍රමාණයකට විනිවිදභාවයෙන් සිදුකර ඇති බවට අපි සතුටින් සඳහන් කරන අතර කාලපරිච්ඡේදය සඳහා තරඟකාරී ලංසුකරුවන් අතර ප්‍රසම්පාදන ප්‍රදානය කිරීමට අදාලව විවාදශීලී ගැටළු නොතිබුණි. තවදුරටත්, සියලුම විගණන වාර්තාවලට අප විසින් ක්ෂණිකව ප්‍රතිචාර දක්වා ඇති අතර ඒවායේ අන්තර්ගත අඩුලුහුකම් නිවැරදි කිරීමට ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කළෙමු. ඒ අනුව මේ වනවිට අප වෙත නොලැබුණු විගණන වාර්තා නොමැති බවට ස්ථිරව සඳහන් කරමු.

අනුකූලවීම පාලනයේ වැදගත් ලක්ෂණයකි. ව්‍යවස්ථා සමග අනුකූලවීම සහතික කිරීම පිණිස කළමණාකරනය විසින් විශේෂ අවධානය යොමුකර ඇත. ඒ අනුව ආදායම් බදු, වැට් බදු වැනි බදු, සේ.අ.අ., සේ.නි.භා.අ. සඳහා ගෙවීම් සියල්ල සමාගම විසින් ගෙවා ඇති අතර වර්ෂය සඳහා විධිමත්ව සම්පූර්ණ කරන ලද වාර්තා සපයා ඇත. අතීත හිඟව පවතින අදායම් බදු පියවීම පිණිස දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමඟ මේ වන විට සාකච්ඡා කරමින් සිටිමු.

රේඛීය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම්වලට (AMC) සමාගම ක්‍රියාකාරීව සහභාගි වේ. විගණන වාර්තාවලට අප විසින් ප්‍රතිචාර දක්වා ඇති අතර නිකුත් කර තිබූ නිර්දේශ හැකි තාක් දුරට ක්‍රියාත්මක කර ඇත.

විගණන සහ කළමනාකරණ කමිටු (AMC) රැස්වීම් පවත්වන ලද දිනයන්

1) 2021.02.19
2) 2021.12.23

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාව එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කරමු.

සමාගමේ කටයුතු සම්බන්ධයෙන් මෙම වාර්ෂික වාර්තාවේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වෙනි වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කරනු ලබන තොරතුරු සහ සමහර අමතර තොරතුරු අන්තර්ගත වේ.

සමාගමේ සහ පරිපාලිත සමාගම්වල මූලික ක්‍රියාකාරකම් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය

වර්ෂය තුළ නොවෙනස්ව පවතින සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් (ලං.වි.ම.) නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රමිතිගත ගල්අඟුරු ආනයනය කොට සැපයීමේ ව්‍යාපාරයයි. ප්‍රමිතිගත ගල්අඟුරු යනුවෙන් අදහස් කරන්නේ, ආනයනය කොට සපයනු ලබන ගල්අඟුරු ගැනුම්කරු (ලං.වි.ම.) විසින් නියම කරනු ලබන විශේෂිත තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල ගල්අඟුරු වීමය.

මූල්‍ය ප්‍රකාශන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් එහි අධ්‍යක්ෂකවරුන් වන බී.කේ. ජගත් කුමාර පෙරේරා මහතා සහ ඒ.ආර්. නවමනි මහතා යන දෙපළ විසින් විධිමත්ව අත්සන් කර ඇත.

විගණකාධිපතිගේ වාර්තාව

සමාගමේ මූල්‍ය විගණනය සිදුකරනු ලබන්නේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාව විගණනය සම්පූර්ණ කළ පසුව ලබාගත හැකිය.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කොට ඇති අතර එහිදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 43 සිට 50 යටතේ සඳහන් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 2,000,000 ක සාමාන්‍ය කොටස් නියෝජනය කරමින් රු. 20,000,000 ක් විය.

අධ්‍යක්ෂකවරුන්

2021 දෙසැම්බර් 31 දිනට නිලතල දැරූ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම්

බී. කේ. ජේ. කේ. පෙරේරා මහතා
ඉංජිනේරු එම්. ආර්. රණතුංග
එස්. ඩබ්ලිව්. මදනායක මහතා
ඩබ්ලිව්. එස්. වීරමන් මහතා
ඒ. ආර්. නවමනී මහතා
ආචාර්ය ඩී. පී. එම්. ටී. ජයමාන්න

2021 වර්ෂය තුළදී පත් කිරීම්

ඩබ්ලිව්.එස්. වීරමන් මහතා -
(2021.08.01 දින සිට)

ඉංජිනේරු එම්.ආර්. රණතුංග -
(2021.08.23 සිට 2022.01.13 දක්වා)

2021 වර්ෂය තුළ ඉල්ලා අස්වීම්

ඩබ්ලිව්.සී. ජයසිංහ මෙනවිය -
(2021.07.31 දක්වා)

එන්.ඩබ්ලිව්.කේ. හේරත් මහත්මිය -
(2021.08.22 දක්වා)

වර්ෂය තුළ සමාගම සමඟ කිසිදු ගිවිසුමකට සෘජුව හෝ වක්‍රව එළඹීමට අධ්‍යක්ෂකවරුන්ට ඇල්මක් නොතිබුණි. සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගම සමඟ පැවැති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 27 පිටු අංක 22 හි දක්වා ඇත.

අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික

සභාපති/කළමනාකර අධ්‍යක්ෂකගේ පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශන සඳහා අතිරේක සටහන "ඈ" පිටු අංක 24, පරිපාලන වියදම් යටතේ අනාවරණය කර ඇති අතර අධ්‍යක්ෂකවරුන් සඳහා ගාස්තුද ඉහත පරිදිම අතිරේක සටහන් "ඈ" හි සඳහන් කර ඇත.

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පරිත්‍යාග

සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් කිසිඳු පරිත්‍යාග යක් සිදුකර නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සංචලනවලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 10 හි දක්වා ඇත.

සංචිත

2021 දෙසැම්බර් 31 දිනට සමාගම සතු සංචිතවල වටිනාකම රු.මි. 106.97 ක් ලෙසට ගණන් බලා ඇත. එහි සංචලනය මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 03 හි දක්වා ඇත.

සේවානියුක්තිය

2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ සේවානියුක්තිය පුද්ගලයින් 23 ක් විය.

බැඳීම් සහ අසම්භාව්‍යතා

2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් සහ අසම්භාව්‍යතා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 24 හි දක්වා ඇත.

විගණකවරුන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 19 වෙනි සංශෝධනයේ 154(1) වගන්තියේ දැක්වෙන ප්‍රතිපාදන ප්‍රකාරව විගණකාධිපති විසින් විගණනය කරන ලදි.

සමාගම සඳහා බදු අනුකූලතා සේවාවන් Messrs' Consultant Consortium හි වරලත් ගණකාධිකාරිවරුන් විසින් සපයන ලදි.

විගණකගේ කාර්යය හැර සමාගම සම්බන්ධයෙන් විගණකවරුන්ට කිසිඳු ඇල්මක් නොමැත.

සමාගම	විගණකගේ/බදු උපදේශකගේ නම	ගෙවීම් වර්ගය	මුදල රු.
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික සමාගම)	විගණකාධිපති	විගණන ගාස්තු + ප්‍රතිපූරණය කළ යුතු වියදම් (බදු හැර)	දැනුම්දී නොමැත
	Consultant Consortium හි වරලත් ගණකාධිකාරිවරුන්	ආදායම් බදු ගණනය කිරීම සහ ප්‍රතිලාභය	45,000.00

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ 154 වැනි ව්‍යවස්ථාවට අනුකූලව ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා පත් කරනු ඇත.

මෙම වාර්ෂික වාර්තාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂකවරුයෙකු විසින් අත්සන් තබනු ලැබේ.

සභාපති **අධ්‍යක්ෂක**

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්ගලික) සමාගම
ලේකම්වරු

අවදානම් කළමනාකරණය

1) වෙළඳපොල අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ගල්අඟුරු මිල සම්බන්ධ වෙළඳපොළ අවදානමට නිරාවරණය වේ. කෙසේ වෙතත් මෙම නිරාවරණය විවෘත අවදානමක් ලෙසත් එය අඩුවන නිරාවරණයක් ලෙසත් අපි අර්ථ දක්වමු. පළමුවෙන්ම සියලුම ප්‍රසම්පාදන ක්ෂණික සහ දීර්ඝකාලීන යන දෙකම (both spot and term) තරඟකාරී ලංසු තැබීම පදනම් කරගෙන සත්‍ය ලෙසින්ම අනුකූල වූ අඩුම මිල ගණන් ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු වෙත ප්‍රදානය කරනු ලැබේ.

තරඟකාරී ලංසු තැබීම ආරම්භ වන්නේ ඉල්ලුම සහ සැපයුම මගින් දක්වනු ලබන තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීමෙනි. ක්ෂණික ප්‍රසම්පාදනවලදී (Spot Tender) මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන යටතේ සියලුම සැපයුම් සඳහා ප්‍රදානය කිරීමේ මිල ස්ථාවරව පවතී. දීර්ඝකාලීන ප්‍රසම්පාදනවලදී (Term Tender) ප්‍රදානය කරන මාසය සහ නෞහාර බිල්පත් මාසය අතර ආගස් ගල්අඟුරු මිල දර්ශකය (Argus Coal Price Index) මගින් චලනය වන නිසා සැපයුම් මිල නම්‍ය කරනු ලබයි. ඉහත කරුණු හැර, ප්‍රසම්පාදන පිරිවිතරවලට අනුව මිල/ තත්ත්ව අනුකූලතාව සහතික කිරීම පිණිස තත්ත්ව මිල ගැලපීම හඳුන්වා දෙනු ලැබේ. එබැවින් ගල්අඟුරු මිල සම්බන්ධයෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමට තිබෙන අවදානම අඩුවන නිරාවරණයක් වේ.

2) ණය අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ එකම මිලදී ගන්නා වන්නේ ලංකා විදුලිබල මණ්ඩලය වන බැවින් එය ණය අවදානමට නිරාවරණය වන්නේ නැත. කෙසේ වෙතත් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වර්තමානයේ ණය අයකර ගැනීම සම්බන්ධ නෛතික කටයුතු සහ ව්‍යාපාර - ව්‍යාපාර කතිකා කරගැනීම සම්බන්ධයෙන් මුළුමනින්ම යොමුවී ඇත. ණය අයකර ගැනීමේ ප්‍රයත්නයන් අතර ප්‍රධාන වශයෙන පහත සඳහන් ණය දැක්විය හැකි අතර එය මේ වන විට දීර්ඝ නීතිමය කටයුත්තක්, බේරුම්කරණයක් සහ කතිකා කරගැනීමක් බවට පත්ව ඇත.

ලංකා නැව් සංස්ථාව (CSC) රු. 539,192,079

ඉහත මුදල ඉන්දියාවේ Taurian Iron and Steel Company Ltd සමාගම වෙත ගල්අඟුරු සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට හිඟව පවතින අතර එකී සැපයුම සඳහා ලංකා නැව් සංස්ථාවට අනුව ඉහත සඳහන් මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ආරවුල විසඳීමේ කාර්යය භාණ්ඩාගාරය, ලංකා නැව් සංස්ථාව, ලං.වි.ම. සහ සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම යන ආයතනවලින් එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් හසුරුවන ලදි. කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අතර ඊට ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටිමු.

Liberty Commodities Ltd., රු. 236,785,640 (එක්සත් ජනපද ඩොලර් 1,575,633)

සත්‍ය වශයෙන්ම අනුකූල වූ අඩුව මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු ලෙස Liberty Commodities Ltd ආයතනය වෙත පළමු ක්ෂණික ප්‍රසම්පාදනය 2015 - 16 දී ප්‍රදානය කරනු ලැබීය. කෙසේ වෙතත්, තත්ත්ව ගැලපීමේ සූත්‍රය මෙහෙයවීමෙන් සහ ප්‍රසාද දීමනා ඉල්ලමින් Liberty Commodities Ltd ආයතනය විසින් ණයවර ලිපිය මත එහි දැක්වෙන මුදලට වඩා වැඩි මුදලක් ලබාගෙන ඇති බවට සොයා ගනු ලැබීය. Liberty Commodities Ltd ආයතනය විසින් වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් multi-prong ක්‍රියාවන් ආරම්භ කර ඇත. මෙම කටයුතුවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

I. වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.

II. මෙම කරුණ සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ උපදෙස් මත සමාන්තර බේරුම්කරණ පටිපාටියක් පවතී.

අවදානම් කළමනාකරණය

III. සමාගම වෙත චික්සත් ජනපද ඩොලර් 1,000,000 ක මුදලක් ගෙවන ලෙස නිකුත් කරන ලද අතුරු බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව Liberty Commodities Ltd ආයතනය විසින් අභියාචනයක් ගොනුකර ඇත.

IV. තවද, Liberty Commodities Ltd ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යසාධන ඇපකරය කැඳවන ලෙස සමාගම විසින් ඉල්ලුම් කර ඇත.

කෙසේ වෙතත්, Liberty Commodities Ltd ආයතනය විසින් සමාගමට එරෙහිව ජිනීවා හි සිවිල් නඩුවක් ගොනුකර ඇත. අපගේ නඩුවට ජිනීවාහිදී පෙනී සිටීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිඥවරුන් අප විසින් නම් කරන ලදි. කෙසේ වෙතත් කාර්යසාධන ඇපකරය, ගල්අඟුරු සැපයීමේදී සිදුවන අඩුපාඩුකම් වෙනුවෙන් පමණක් සීමා වන නිසාත් ඇණවුම් කරන ලද ප්‍රමාණය නිසි පරිදි භාරදුන් බවත්, භාරගත් බවත් සමාගම විසින් ලිඛිතව තහවුරු කළ නිසාත් අධිකරණය විසින් Liberty Commodities Ltd ආයතනයට පක්ෂව තීන්දුව ලබාදෙන ලදි.

කාර්යසාධන සමාලෝචනය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් වන වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාවය නොරොච්චොලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රසම්පාදනය කොට ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීමය. ගල්අඟුරු මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ සිට ප්‍රසම්පාදන කැඳවීම සහ නිම කිරීම, ප්‍රසම්පාදනය කිරීම සහ ලක්විජය ගල්අඟුරු බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය යන සියලුම ක්‍රියාකාරකම් වෙනුවෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වගකීමෙන් බැඳී සිටී. සෑම වසරකම සැප්තැම්බර් සිට ඊළඟ වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා පුත්තලම වෙරළ නිරිතදිග මෝසම් සුළඟින් තදබල ලෙස බලපෑමට ලක්වන නිසා ඉහතින් සඳහන් කළ ගල්අඟුරු ප්‍රමාණය දින 210 ක් වැනි සීමිත කාලපරිච්ඡේදයක් තුළ සැපයිය යුතුය. එබැවින්, ගල්අඟුරු ප්‍රවාහනය කිරීම් මාස 5 ක කාලයක් අත්හිටුවන බවට අපේක්ෂා කෙරේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මෙහෙවර වන්නේ ලක්විජය ගල්අඟුරු බලාගාරය මඟින් විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ඉහළ ප්‍රමිතියකින් යුත් ගල්අඟුරු නියම මිලට සැපයීම, ගල්අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍ය කළමනාකරණය කිරීම, ඒවා පරිසර හිතකාමී නව්‍ය නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සහ එකී නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම, තාප බලශක්ති ප්‍රභවයක් ලෙස ගල්අඟුරු පෞද්ගලික අංශය සඳහා ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් වඩා ශක්තිමත් කිරීම සහ එමඟින් රටේ සංවර්ධනයට දායකවීම වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික විදුලිබල පද්ධතියේ ප්‍රාථමික බලශක්ති ප්‍රභවය ලෙස LVPP දෛනික විදුලි ජනනයෙන් 40% සිට 50% දක්වා දායක වේ. මාස 7ක ගල්අඟුරු සැපයුම සීමා වීම හේතුවෙන් අප්‍රේල් අග සිට සැප්තැම්බර් අග දක්වා පුත්තලම නැංගුරම් පොළට ගොඩබෑමක් සිදු නොවේ. භාණ්ඩාගාරය විසින් පත් කරන ලද TEC සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද SSCAPC සහ SCAPC අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව සියලුම ක්ෂණික සහ දීර්ඝකාලීන ප්‍රසම්පාදන නිර්දේශ කර අනුමත කරනු ලැබේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කළ හැකිය.

I. සැපයුම්කරුවන් ලියාදිංචි කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ප්‍රදානය කිරීම.

II. ණයවර ලිපි විවෘත කිරීම, බැංකුකරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, බැංකු පහසුකම් විධිමත් කිරීම භාණ්ඩාගාර ඇපකර සහ ලේඛන පවත්වා ගැනීම.

III. ප්‍රසම්පාදනය, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ගල්අඟුරු පැටවූ ස්ථානයේ සිට ජැටිය දක්වා මාරු කිරීම සඳහා ගැල්කුලී සහ බත්තල් සේවා.

IV. ගැනුම්කරු (ලක්විජය ගල්අඟුරු බලාගාරය), සැපයුම්කරුවන්, පර්යන්ත මෙහෙයුම්කරුවන්, ශ්‍රී ලංකා රේගුව, රක්ෂණ, නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සහ පාර්ශවකරුවන් අතර විවිධ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.

V. සපයන ලද ප්‍රමාණය සත්‍යාපනය කිරීමෙන් පසුව සහ තත්ත්ව ගැලපීමේ සූත්‍රය අදාල කරගනිමින් ඉන්වොයිසියේ වටිනාකම්න් 80% ක් සහ 20% ක් නිදහස් කිරීම පිණිස භාරගැනීමේ සහ තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම.

ගල්අඟුරු ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය

ආරම්භක ගල්අඟුරු 2015.07.23 සහ 2015.10.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පරිදි දීර්ඝකාලීන ප්‍රසම්පාදන (Term Tenders) ඔස්සේ ප්‍රසම්පාදනය කරනු ලබන අතර ගල්අඟුරු ප්‍රසම්පාදන ක්‍රම දෙකක් එනම් දීර්ඝකාලීන සහ කෙටිකාලීන (ක්ෂණික) ප්‍රසම්පාදන යටතේ සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලදි.

තෝරාගත් ගල්අඟුරු සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති ගැල්කුලී අනුපාත සංසන්දනය කිරීම පදනම් කරගෙන ගල්අඟුරු පටවනු ලබන වරායේ සිට ඒවා නිදහස් කිරීමට නැංගුරම් ලා සිටින වරාය දක්වා ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාව (සීක) විසින් මෙහෙයවනු ලබයි.

කාර්යසාධන සමාලෝචනය

ගල්අඟුරු බත්තල් මගින් පුත්තලම නැංගුරම්පළේ සිට ලක්විජය බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මගින් සිදුකරනු ලබන අතර ඔවුන්ගේ බත්තල් සේවා සැපයුම්කරු විසින් මෙහෙයුම් කටයුතු සිදුකරනු ඇත.



කාර්යසාධන සමාලෝචනය

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ බලයලත් සාමාජිකයන්

LVPP හි වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවයට අනුව, සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ගල් අඟුරු ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරයි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ විශේෂ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලදී. (SSCAPC) මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය අංශය විසින් පත් කරනු ලැබේ.

තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහ විශේෂ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (SSCAPC) මත පදනම් වූ කැබිනට් අනුමැතියේ නිර්දේශයට අනුව සියලුම ගල් අඟුරු නැව්ගත කිරීම් බලාගාරයට සපයා ඇත.

තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (SCAPS) සංයෝජනය පහත පරිදි වේ,

දීර්ඝකාලීන ප්‍රසම්පාදන සඳහා SCAPC සහ TEC සාමාජිකයන්	
SCAPC	TEC
ලේකම් - බලශක්ති අමාත්‍යාංශය (සභාපති)	AGM - ජනන/ලංවිම (සභාපති)
ලේකම් - විදුලිබල අමාත්‍යාංශය	PPM - LVPP, ලංවිම
ලේකම් - සූර්ය, සුළං සහ ජලජ ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	අධ්‍යක්ෂක - MOP
අතිරේක ලේකම් - ERD, මුදල් අමාත්‍යාංශය	AFM (ජනන) -ලංවිම
සාමාන්‍යාධිකාරී, ලංවිම	අධ්‍යක්ෂක - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
	සාමාන්‍යාධිකාරී - LCC
	අතිරේක සාමාන්‍යාධිකාරී - CSC
	මූල්‍ය කළමණාකරු - LCC
	සිවිල් ඉංජිනේරු - පරිසර, ලංවිම
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - DOME/මොරටුව විශ්වවිද්‍යාලය

ක්ෂණික ප්‍රසම්පාදන සඳහා SSCAPC සහ TEC සාමාජිකයන්	
SSCAPC	TEC
ලේකම් - කම්කරු අමාත්‍යාංශය (සභාපති)	AGM - ජනන/ලංවිම (සභාපති)
ලේකම් - බලශක්ති අමාත්‍යාංශය	PPM - LVPP, ලංවිම
නියෝජ්‍ය අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව	අධ්‍යක්ෂක - TT,T&D/MOP
අතිරේක ලේකම් - මුදල් අමාත්‍යාංශය	AFM භාණ්ඩාගාරය / ලංවිම
සාමාන්‍යාධිකාරී, ලංවිම	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
	සාමාන්‍යාධිකාරී - LCC
	අතිරේක සාමාන්‍යාධිකාරී - CSC
	කළමණාකරු - CPC
	සිවිල් ඉංජිනේරු - TDE, ලංවිම
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - DOME/මොරටුව විශ්වවිද්‍යාලය

කාර්යසාධන සමාලෝචනය

ගල් අඟුරු මෙහෙයුම්



ගල් අඟුරු වාරය 2021 - 2022

ගල් අඟුරු සැපයුමේ ප්‍රසම්පාදනය සහ ක්‍රියාකාරිත්වය සෑම විටම වර්ෂ 2ක කාලයක් පුරා ව්‍යාප්ත වී ඇති අතර ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

2015-2016 වාරයේ දී ලබා දුන් කැබිනට් තීරණයක් මත දීර්ඝකාලීන ප්‍රසම්පාදන (LTT) සහ ක්ෂණික (Spot) (ST) ප්‍රසම්පාදන පටිපාටිය හඳුන්වා දී ඇත. ඒ අනුව වසරක ගල් අඟුරු ප්‍රමාණය වාර දෙකක දී සැපයීම සඳහා බක්ක දීර්ඝකාලීන ප්‍රසම්පාදන කැඳවයි. එක් එක් වාරය සඳහා LVPP විසින් ඉල්ලා සිටින ගල් අඟුරු ප්‍රමාණය ලැබීමෙන් පසු එක් එක් වාර සඳහා ක්ෂණික ප්‍රසම්පාදන කැඳවනු ලැබේ. ඒ අනුව එක් එක් වාරයේ ගල් අඟුරු ඉල්ලූම ආසන්න වශයෙන් 50% දීර්ඝකාලීන ප්‍රසම්පාදනවලින් සහ 50% ක් ක්ෂණික ප්‍රසම්පාදනවලින් ලබා ගනී.

ප්‍රසම්පාදන දෙකම CFR (FOB - භාණ්ඩ ප්‍රවාහනය) පදනම මත කැඳවනු ලබන අතර, භාණ්ඩාගාර චක්‍රලේඛය 415 අනුව SCAPC විසින් තෝරා ගන්නා ලද ලංසුවේ භාණ්ඩ ප්‍රවාහන සංවිධායකයේ මිලට ගැළපීමට ලංකා නැව් සංස්ථාවට (CSC) අවස්ථාව ලබා දෙනු ඇත. ඒ අනුව, CSC ඔවුන් භාණ්ඩ ප්‍රවාහන සංවිධායකයට ගැලපෙන්නේ නම්, ඔවුන් පැටවීමේ වරායේ සිට පුත්තලම නැංගුරම් පොළට ගල් අඟුරු ප්‍රවාහනය කළමනාකරණය කරනු ඇත.

තවද, CSC විසින් ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවනු ලබන අතර පුත්තලම නැංගුරම් පොළේ සිට LVPP ජැටිය දක්වා ගල් අඟුරු ප්‍රවාහනය කිරීම සඳහා භාණ්ඩ ප්‍රවාහන සේවා සපයන්නා ලෙස ප්‍රතිචාර දක්වන ලද අඩුම ලංසුකරු තෝරා ගනු ඇත.

ලංකා ගල් අඟුරු සමාගම ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන නියෝජිතායතනයක් ලෙස ක්‍රියා කරන අතර අවශ්‍ය පරිදි ප්‍රසම්පාදන කමිටු SCACP/SSCAPC සහ ඊක වෙතින් කලින් කලට සියලූම නිර්දේශ සහ අනුමැතිය ලබා ගනී. TEC, SCAPC/SSCAPC යන දෙකම මුදල් අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන අතර සාමාන්‍ය බක්ක ප්‍රසම්පාදන කැඳවනු ලබන්නේ SCAP/SSCAPC අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණි.

කාර්යසාධන සමාලෝචනය

2021 - 2022 ගල් අඟුරු වාරයේ සාක්ෂාත් කරගැනීම්

1. API4 ගල් අඟුරු දර්ශක මිල මෙටක් ටොන් එකකට ඩොලර් 200 ට වඩා විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් ඔක්තෝබර් මාසයේදී ගල් අඟුරු මිලදී නොගැනීමෙන් විදුලිබල අමාත්‍යාංශය, ලංවිම, LCC සහ අනෙකුත් පාර්ශවකරුවන් ඇතුළුව ඩොලර් මිලියන 18.6 (රුපියල් මිලියන 3,775) ක් ඉතිරි කර ගැනීමට හැකි වී තිබේ.
2. එම කාලය තුළම ලංවිම සමඟ සම්බන්ධීකරණයෙන් LVPP ගල් අඟුරු අවශ්‍යතාවය නැවත ගණනය කිරීමෙන් නැව්ගත කිරීම් 40 සිට 38 දක්වා අඩු කිරීමට LCC කටයුතු කරයි, එබැවින් අපට USD මිලියන 16 (රුපියල් මිලියන 3,248) ක් පමණ ඉතිරි කර ගැනීමට හැකි වී තිබේ.
3. 2021-2022 වාරය සඳහා ඇස්තමේන්තුගත මුළු ගල් අඟුරු ආනයන වියදම USD මිලියන 340 (රු. මිලියන 69,020) වේ.
4. කෝප් කමිටුව සහ විදුලිබල අමාත්‍යාංශය විසින් ලබා දී ඇති උපදෙස් අනුව රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමෙන් ලංකා ගල් අඟුරු සමාගමට (LCC) දිගුකාලීන ගල් අඟුරු සැපයීමේ හැකියාව ගවේෂණය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක අපි නිරතව සිටිමු. ඒ අනුව දකුණු අප්‍රිකාව, රුසියාව, කොලොම්බියාව සහ පෝලන්තය වැනි විවිධ රටවලින් LCC වෙත යෝජනා පහකට වඩා ලැබී ඇත.

වාණිජ අරමුණු ලුහුබැඳීම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම එය සංස්ථාපනය කළ මුල් වසරවලදී විදුලිබල මණ්ඩලයට ගල් අඟුරු සැපයීම මත මෙට්‍රික් පදනම් වූ මිල අනුව අය කිරීම සිදු කළේය. එබැවින් සමාගමේ කාර්ය සාධනය මැනිය හැකි විය. 2014 සිට ලංවිම මිලකරණ ව්‍යුහය වෙනස් කළ අතර ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමට සමාගමේ ශුද්ධ පොදු කාර්ය පිරිවැයට සමාන ගාස්තුවක් ලබා දෙන ලදී. LCC විසින් උපයාගත් සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු, පොලී වැනි අනෙකුත් ආදායම්වලින් දළ පොදු කාර්ය පිරිවැයේ වෙනස ශුද්ධ පොදු කාර්ය ලෙස නිර්වචනය කරන ලදී. ශුද්ධ පොදු කාර්ය පාදක ගාස්තුව ක්‍රියාත්මක කිරීමත් සමඟ වාණිජමය අවධානය ලුහුබැඳීම අවම පිරිවැයකින් ප්‍රතිස්ථාපනය විය. මූලාශ්‍රකරණයේ ප්‍රශස්ථ පිරිවැය සහතික කිරීම සඳහා ඇතැම් මිනුම් ලකුණු එතැන් සිට භාවිතයේ පවතී.

කාර්යසාධන සමාලෝචනය

ඉල්ලුම තෘප්තිමත් කිරීම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම පසුගිය වසර පහ තුළ බඩුජඡ හි ඉල්ලුම සම්පූර්ණයෙන්ම තෘප්තිමත් කර ඇති බව පහත ප්‍රස්තාරික නිරූපණයෙන් පැහැදිලි වේ



	2017/18	2018/19	2019/20	2020/21	2021/22
Demand	2,200,000.00	2,100,000.00	1,920,000.00	2,520,000.00	2,280,000.00
Supply	2,209,983.00	2,117,165.00	1,867,744.00	2,419,940.00	2,120,708.00

රක්ෂණ අනුපාත අඩු කිරීම

2016 - 2017 වාරයේ රක්ෂණ ගාස්තු මෙ.ටොන් එකක් සඳහා ඒ.ජ.ඩො 0.05 වූ අතර එය 2017/2018 සහ 2018/2019 දී මෙ.ටොන් එකක් සඳහා ඒ.ජ.ඩො 0.048 සිට ඒ.ජ.ඩො 0.025 දක්වා අඩු වී ඇති අතර 2019/20 වාරයේ එය 25/MT25/MT01 විය. මෙය ගල් අඟුරු පිරිවැයේ කැපී පෙනෙන අඩුවීමක් ද වේ.



	2016 – 17	2017 - 18	2018 - 19	2019 - 20	2020 - 21	2021 - 22
Series1	0.05	0.048	0.048	0.025	0.0125	0.0125

අනාගත උපායමාර්ගික සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මගපෙන්වීම මත සමාගම පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබේ.

- **LCC ක්‍රමවත් කිරීම සඳහා SORP, අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි අත්පොත සහ අනෙකුත් ක්‍රියාපටිපාටි සකස් කිරීම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම සුදුසු SORP නොතිබුණි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙහි SORP සකස් කිරීම සඳහා අබණ්ඩ ක්‍රියාමාර්ගයක් පවතින අතර දැනට සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය LCC විසින් සකස් කරන ලද SORP කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් (ලංවිමෙන් දෙදෙනෙකු, කීකයෙන් එක් අයෙකු, අමාත්‍යාංශයෙන් එක් අයෙකු සහ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙන් එක් අයකුගෙන්) සමන්විත කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබේ.

- **පෞද්ගලික අංශයට ගල් අඟුරු සැපයීම**

ශ්‍රී ලංකාවේ උදුන්/බොයිලේරු සඳහා තාප ගල් අඟුරු භාවිත කරන කර්මාන්තකරුවන් ස්වල්ප දෙනෙක් සිටිති. ඔවුන්ට ඉතා කුඩා ප්‍රමාණ අවශ්‍ය වන අතර පිරිවිතර වෙනස් විය යේ. ඒ නිසා සියලුම කර්මාන්තකරුවන් තෘප්තිමත් කිරීමට එක ගල් අඟුරු තොගයක් ගෙන ඒම අපහසුය. කෙසේ වෙතත්, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම කුඩා ගල් අඟුරු තොගයක් මුලින් ගෙන ඒම සඳහා ඔවුන් සමඟ සාකච්ඡා කරමින් සිටී.

- **තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව පුළුල් කිරීමේ පදනම**

මේ සඳහා දැනටමත් කටයුතු සිදුවෙමින් පවතින අතර මේ වන විට සැපයුම්කරුවන් 26 දෙනෙකු ලියාපදිංචි කර ඇති අතර දැනට 17 ක් ක්‍රියාත්මක වේ. එසේම, 2020 වසර අවසානයේ සිට, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව, ජාත්‍යන්තර ක්‍රියාපටිපාටිය අනුව සෑම වසරකම අදාළ තානාපති කාර්යාල හරහා පුළුල් ප්‍රචාරයක් සිදුකිරීමටත්, සෑම වසරකම සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය විධිමත් කිරීමටත්, තෙවසරක යෝග්‍යතා පරීක්ෂණයකින් පසු නැවත ලියාපදිංචි වීමටත් කටයුතු සම්පාදනය කෙරේ.

- **මිලදී ගැනීමේ මිලෙහි අතරමැදි පිරිවැය වළක්වා ගනිමින් ලංසු ඉදිරිපත් කරන ලෙස පතල් හිමියන්ට ආරාධනා කිරීම**

ගල් අඟුරු පතල්කරුවන්ටද අපගේ ප්‍රසම්පාදන සඳහා සෘජුවම ලංසු ඉදිරිපත් කළ හැකි ආකාරයට ප්‍රසම්පාදනය සිදු කෙරේ. ප්‍රධාන ගල් අඟුරු පතල් කම්කරුවෙකු වන Glen core ද දැනට සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී ඇත. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා උපයෝගී කර ගනිමින් දෙරට අතර සෘජු ගල් අඟුරු (රාජ්‍යන් අතර) මිලදී ගෙන රටට පහසුකම් සැලසීමට අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනිමින් සිටී.

- **ගල් අඟුරු දහනයෙන් විමෝචනය වීමේ බලපෑම්වලට එරෙහිව හරිත ආර්ථිකයි ප්‍රවර්ධනය කිරීම**

- **ගල් අඟුරු දහන ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදන ලෙස කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන් වැනි නව නිෂ්පාදන නිස්සාරණය කිරීම**

අනාගත උපායමාර්ගික සැලැස්ම

- **මාස හයක මෝසම් කාලයෙන් ඉකුත් පිටවීදින 365 බෙදාහැරීම් යථාර්ථයක් බවට පත් කිරීමට නොපසුබස්නා උත්සාහය**

මේ සඳහා විකල්ප යෝජනා කිහිපයක් ඉදිරිපත් වී ඇති අතර අමාත්‍යාංශයේ සහ විදුලිබල මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව ඒකාබද්ධව කටයුතු කරමින් පවතී.

- පවතින ජැටිය පුත්තලම නැංගුරම් පොළ දක්වා දීර්ඝ කිරීම (කිලෝමීටර් 4)
- LCC යාත්‍රා ප්‍රමාණය 60,000±10%MT සිට 65,000±10% MT දක්වා වැඩි කිරීමට සැලසුම් කිරීම
- ජැටිය දෙපස ගොඩබෑමේ පහසුකම
- ගියර් රහිත විශාල යාත්‍රා භාවිතා කර ප්‍රතිනැව්ගත කිරීම් භාවිතයෙන් බෑම
- නැංගුරම දක්වා ජැටිය දිගු කිරීම
- ත්‍රිකුණාමලයේ සිට ගල් අඟුරු ප්‍රවාහනය ත්‍රිකුණාමලයේ සිට මහව දක්වා දුම්රිය මාර්ගය ලක් විජය බලාගාරය දක්වා දීර්ඝ කිරීම.

- **ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම ඉහත සැලසුම් 2 නිසි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. ඉහත සැලසුම් දෙක සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එය විධිමත් කර ඇති අතර ඒවා විධිමත් අනුමත ක්‍රියා පටිපාටි සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ.

- ලංවිම මගින් පිරිවැය ප්‍රතිපූරණය කිරීම වෙනුවට LCC ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම.

- රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම හරහා ලංකා ගල් අඟුරු සමාගමට (LCC) දිගුකාලීන ගල් අඟුරු සැපයීමේ හැකියාව ගවේෂණය කිරීම. මේ වන විට එම ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර දකුණු අප්‍රිකාව, බ්‍රසීලය, පෝලන්තය සහ රුසියාව යන රටවලින් යෝජනා හතරක් ලැබී ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ මඟපෙන්වීම යටතේ පත්කළ කමිටුව යෝජනා ඇගයීමට ලක් කරනු ලැබේ.

- සමාගම සඳහා සුදුසු කාර්යාල අවකාශය හඳුනා ගැනීම.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.



සභාපති
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 12) 88 ඡේදය ප්‍රකාරව, චිකතු කළ අගය මත බදු තක්සේරු කිරීම් සම්බන්ධයෙන්, 2017/2018 සහ 2018/2019 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු අතිරේක බදුවලට අදාළව රු.287,139,348 ක් සහ ඊට අදාළව ගෙවිය යුතු දඩ රු.220,628,092 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 154 නැව්ගත කිරීම් අවිනිශ්චිත ගිණුමේ රු. 33,317,325 ක ශේෂයක් පියවීමට සහ ප්‍රසම්පාදන - ගල් අඟුරු සඳහා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු අත්තිකාරම් ගිණුමට අදාලව රු.1,760,500 ක ශේෂයක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස ඇත්ත වශයෙන්ම සිදු නොවූ, රේගුවේ වටිනාකම සඳහා පිරිවැයට සියයට 10 ක ආන්තිකයක් චිකතු කරන ලදී. කෙසේ වෙතත්, සමාගම විසින් රු.5,324,423,778 ක් වූ පිරිවැය මත සියයට 10 ක ආන්තිකයක් ආදායමට චිකතු කර ඇති අතර පසුව සමාගම ණය ගැතියන්ට චම වටිනාකම වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා ඇත. චිහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම් සමාන ප්‍රමාණයකින් අධිගණනය වී තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු වැට් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් රු.197,452,711 ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. ඒ අනුව, චම මුදල්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.22,502,205 ක් වූ කළමනාකරණ ගාස්තු වසර 3 කට වැඩි කාලයක සිට හිඟව පැවතුනි. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල සලසා නොතිබුණි.

(ඊ) ලැබී ඇති තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි වටිනාකම ප්‍රකාශ නොකිරීම හේතුවෙන් සමාගම රු.205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට ගෙවා ඇති බව නිරීක්ෂණය විය. 2019 වසරේ සිදු කරන ලද දඩ මුදල් ගෙවීම, අදාළ වර්ෂවල වියදම් ලෙස ගණන් නොගෙන ඒ වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් බදු ගිණුම, වැට් පාලන ගිණුම සහ ලංකා නැව් සංස්ථාව (CSCL) වගකීම් ගිණුම යටතේ ගිණුම්ගත කර ඇත. චිහි ප්‍රතිඵලයක් වශයෙන්, රඳවාගත් ඉපැයීම් රු.205,000,000 කින් වැඩියෙන් දක්වා ඇති අතර, සමාලෝචන වර්ෂය යටතේ ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ කීකබ වගකීම් ගිණුම පිළිවෙලින් රු.158,186,165, රු.39,970,418 සහ රු.6,843,417කින් අඩුවෙන් දක්වා ඇත.

(උ) සීමාසහිත ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (TISCL) වෙතින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා ලැබිය යුතු රු.539,192,079 ක දිගුකාලීන හිඟ ශේෂයක් අයකර ගැනීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදන වෙන් කිරීම් කර නොතිබුණි. තවද, TISCL/CSCL විසින් නියමිත ශේෂය තහවුරු කර නොතිබුණි. චිබැවින් ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.

(උ) විවිධ ණය ගැතියන් වූ රු.18,075,801 ක්, පුද්ගලික සමාගමකින් ලැබිය යුතු මුදල් රු.1,115,987 ක්, එම පුද්ගලික සමාගමේම වෙළඳ ණය හිමියන්ගේ ශේෂය රු. 85,887,776 ක් සහ වෙනත් පුද්ගලික සමාගමකින් ලැබිය යුතු සියයට 50 ක SGS ගාස්තුව වූ රු.8,048,531 ක් සත්‍යාපනය කිරීමට අදාළ ශේෂය තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත්ව නොතිබුණි.

(ව) නැවිගත කිරීමේ අංක 123 සඳහා සමාගම විසින් රු.136,236,370 ක් රේගු වැට් බද්ද ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගු ප්‍රකාශනය අනුව සත්‍ය වැට් බද්ද රු.106,969,404ක් පමණක් විය. ඒ අනුව සමාගම රු.29,266,965 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයේදී සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය සහ ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු බවට ලංකා නැව් සංස්ථාව විසින් තහවුරු කරන ලද ශේෂය අතර රු.4,003,372 ක හඳුනානොගත් වෙනසක් තිබුණි. කෙසේ වෙතත්, එම වෙනස සැසඳීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු රු.2,362,129 ක ශේෂයකට අදාළ ශේෂය තහවුරු කිරීම් සහ අනෙකුත් අදාළ ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමියි.

සමාගමේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

18 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (ස) (ඈ) (සඩ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ), (උ෯) සහ (ඒ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අඳාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

රෙගුලාසි / නියෝගවලට යොමුව	විස්තරය
(අ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
(i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	(i) සමාගම බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් (SORP) සකස් කර තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. (ii) චක්‍රලේඛයට පටහැනිව සමාගම 2017 වසරේ සිට ආපදා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. (iii) අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සමාගම විසින් ප්‍රයෝජනයට නොගත් කාර්ය මණ්ඩල අසනීප නිවාඩු සඳහා රු.1,916,044 ක ප්‍රතිපාදන සලසා තිබුණි.
(ii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සමාගම විසින් නියමිත අනුමැතිය ලබා නොගෙන රු.1,958,534 ක ප්‍රසාද දීමනාවක් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඔබේ අංකය : PWR/B/LCC/FS/2021/20
2022 අගෝස්තු 12

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය වෙත,

මහත්මයාණෙනි,

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා නිරීක්ෂණ

ඉහත කරුණ සම්බන්ධයෙන් 2022.08.10 දිනැති විගණකාධිපති වාර්තාව සඳහා අපගේ නිරීක්ෂණ මෙහි ඉදිරිපත් කෙරේ.

1.2 මතය සඳහා පදනම

1.2 (අ) සඳහා පිළිතුර

ලැබී ඇති චකතු කළ අගය මත බදු තක්සේරුව සඳහා වූ අභියාචනා සමඟින් ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) විසින් සංශෝධිත වැට් බදු වාර්තා 04 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, වී සඳහා සාකච්ඡා සිදුවෙමින් පවතී.බදු උපදේශකවරයාගේ සහාය ඇතිව 2022/06/06 දින පළමු රැස්වීම සාර්ථකව සිදු කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය නම්, ඉදිරි මූල්‍ය වර්ෂයේදී හෙළිදරව්කිරීම් කරනු ඇත.

1.2 (ආ) සඳහා පිළිතුර

පහත දැක්වෙන පරිදි අවිනිශ්චිත ගිණුම් අඩංගු වේ.

වර්ෂය ආරම්භය වන විට අවිනිශ්චිත ගිණුමේ ශේෂය :	4,323,787.00
2021 වර්ෂයේදී මාරු කරන: ලද වටිනාකම	30,757,506.00
2021 වර්ෂය අවසානයේදී අවිනිශ්චිත ගිණුමේ ශේෂය :	35,081,293.00

අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂයේ අඩංගු වන්නේ:

විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.4,323,787.00 : 2017 වර්ෂයේදී ලංවිම සමඟ ගිණුම පියවීමෙන් පසු ඉතිරි වූ මුදල. මූලාශ්‍රය/මූලාරම්භය සොයා ගැනීමට තවදුරටත් විමර්ශනය කෙරේ.

2021 වර්ෂයේදී මාරු කළ මුදලෙහි අඩංගු වන්නේ:

මර්කේටර් වෙත ගෙවිය යුතු මුදල ගිණුම්කරණයේ ප්‍රතිඵලයක් විය. ඒ වන විටත් අදාළ මුදල විදුලිබල මණ්ඩලයෙන් ලැබී තිබුණත් එය ගිණුම්වල පිළිබිඹු නොවීම නිසා එය අවිනිශ්චිත ගිණුමට හරකර තබාගෙන ඇත. 2022 මූල්‍ය වර්ෂයේ අවිනිශ්චිත ගිණුම ඉවත් කිරීම සඳහා මූලාශ්‍රය/මූලාරම්භය සොයා ගැනීමට තවදුරටත් විමර්ශනය කෙරේ.

1.2(ඇ) සඳහා පිළිතුර

ලංකා විදුලිබල මණ්ඩලය වෙත වැට් බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී රේගු ආන්තිකය පිරිවැයට චකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් LCC වෙත මග පෙන්වීමක් ලබා දෙන ලදී.දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය අනුගමනය කරන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරියා වාර්තා සහ සටහන් කර ඇති

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2021 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ආකාරයට ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන ඉන්වොයිසි මත LCC හි වැට් බද්ද සඳහා පදනම්වන වටිනාකම රේගු අරමුණු සඳහා වන වටිනාකමට වඩා අඩු විය නොහැකි බව පවසා ඇත. එබැවින් 10% එකතු කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියාගේ මග පෙන්වීම මත පමණි. ලංකා විදුලිබල මණ්ඩලය විසින් එම මග පෙන්වීම අභියෝගයට ලක් කර දේශීය ආදායම් (IR) වෙත 2018.09.07 දිනැති ලිපිය මගින් ලියා ඇති අතර එයට ප්‍රතිචාරය තවමත් ලැබී නොමැත. එතෙක් අපි ඉන්වොයිසියට සියයට 10 රේගු ආන්තිකය එකතු කළ නමුත් IRD විසින් නිකුත් කරන ලද අතුරු නියෝගයක් නිකුත් කිරීමේදී අතිරික්ත නිමැවුම් VAT කිසිවක් IRD වෙත ප්‍රේෂණය නොකරන්නෙමු. ආදායමේ අන්තර්ගතය වන 10% සංකල්පීය ආන්තිකය ඉවත් කර නිමැවුම් වැට් බද්ද ගණනය කිරීමේ හැකියාව පිළිබඳව බක්ක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා ඇති අතර, ප්‍රතිචාරය තවමත් ලැබී නැත. එපමණක් නොව, 2022 අප්‍රේල් 4 වන දින ගල් අඟුරු ආනයනය සහ සැපයීම සඳහා වැට් බද්ද නිදහස් කරන ලෙස ඉල්ලා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යොමු කර තිබේ.

1.2(ඈ) සඳහා පිළිතුර

LCC විසින් 2021 වර්ෂය අවසාන විගණනය සඳහා රු.197,452,711 ට සමාන අවසාන වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් තහවුරු කිරීමක් ඉල්ලා සිටි නමුත් මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විටත් ඔවුන් විසින් තහවුරු කර නොතිබුණි.දැනට පවතින කළමනාකරණ සාකච්ඡා මත පදනම්ව නුදුරු අනාගතයේ දී අවසන් කිරීමට නියමිත ඉහත සඳහන් ගෙවිය යුතු මුදල පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලය දැනට කටයුතු කරමින් සිටී.

රු.35,081,293.00 යනු අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන අතර එය පිළිතුරු 1.2 (ඇ) යටතේ විස්තර කර ඇත.

1.2(ඉ) සඳහා පිළිතුර

2020 ජුනි 17 වන දින ලක් විජය විදුලි බලාගාරයේ (LVPP) විදුලි බලාගාර කළමනාකරු කාර්යාලයේ පැවති රැස්වීමට අනුව, අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන) [AGM(G)] LCC විසින් 2016, 2018 සහ 2019 වර්ෂ සඳහා ලැබිය යුතු හිඟ කළමනාකරණ ගාස්තු සඳහා , සියලූ වියදම් කළේ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ව්‍යාපාරික ගණුදෙනුවලටල බව පවසමින්, සාධාරකරණ ලිපියක් එවන ලෙස ඉල්ලා සිටියේය. ඉහත සඳහන් ලිපිය යැවීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම හිඟ මුදල් පියවනු ඇත.

1.2(ඊ) සඳහා පිළිතුර

ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශ කර නොමැත.එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව (CSC) විසින් රේගු ප්‍රකාශනයන් සම්පූර්ණයෙන්ම හසුරුවන ලද අතර එක් නැවිගත කිරීමකට රු. 1,000,000 සහ ශ්‍රී ලංකා රේගුව විසින් ඉහත වැරදි ප්‍රකාශය මත LCC වෙත රු. 205,000,000 ක දඩ මුදලක් පනවා තිබුණි.මෙම ගෙවීමෙන් පසු අවසන් වැට් බදු ගෙවීමක් සිදු නොකරන ලෙස ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් LCC නිලධාරීන්ට දන්වා තිබුණි. ලංකා විදුලිබල මණ්ඩලය මේ වන විට බක්ක වෙත ගෙවිය යුතු ඉහත සඳහන් කළ ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින අතර එය නුදුරු අනාගතයේ දී අවසන් කිරීමට නියමිතය.තවද LCC විසින් ඉහත වැරදි ප්‍රකාශය හේතුවෙන් සැබෑ දඩ මුදල රු.6,843,417.00 හඳුනාගෙන CSC වගකීමට එරෙහිව හර කර ඇත.

1.2(උ) සඳහා පිළිතුර

ඉහළ මට්ටමේ කමිටුවක් විසින් ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් බේරුම්කරණය හසුරුවන ලදී. කමිටුව ණය බොල් ණය ලෙස තීරණය කර

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

නොමැති අතර ගල් අඟුරු ලබා දීමෙන් ණය පියවීමට ගැනුම්කරු එකඟ වී ඇත. අපට ලැබී ඇති තොරතුරු අනුව බේරුම්කරණ යෝජනාව සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.ලංකා නැව් සංස්ථාවෙන් (ට්‍රෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම) ලැබිය යුතු හිඟ මුදලේ වත්මන් තත්ත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර, එහිදී සීමාසහිත ට්‍රෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය බලාගාරය, ලංකා ගල් අඟුරු සමාගම යන සිව් පුද්ගල කමිටුවක් පත් කර ඇත.තවද, කමිටු නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙසද අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇති අතර එය මෙතෙක් සිදු කර නොමැත.

1.2 (උ) සඳහා පිළිතුරු: ශේෂය තහවුරු කිරීම් සහ සාක්ෂි.

i. විවිධ ණය ගැතියන් රු.18,075,802

මූලික විමර්ශනවලින් හෙළි වූයේ එම මුදල ආපසු අයකරගත නොහැකි NBT සහ PAL හි රු.17,839,949 ක් වන බවයි. මූලාශ්‍රය/ මූලාරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ.

ii ලැබිය යුතු මුදල් - රු.1,115,987

නොබෙල් රෙසෝර්සස් (Noble Resource) සඳහා රු.85,887,776 ක ණයහිමි ශේෂයක් ඇති අතර අපි මෙම ණයගැති ශේෂය ඊට එරෙහිව හිලව් කරන්නෙමු.

iii. වෙළඳ ණයහිමියන්*රු.85,887,776

ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ ණයවර ලිපි (LC) වලංගු කාලසීමාව අවසන් වීම හේතුවෙන් Nobel Recourses Intl. (Pvt.) බව්ා විසින් ලබා ගන්නා ලද අඩු මුදලකි.

iv ලැබිය යුතු 50% වූ SGS ගාස්තු රු.8,048,531

2015/16 වාරයේ නැව් අංක 17 සඳහා ගොඩබාන වරායේදී නැව් තොගයේ බර මිණුම්කරණ ගාස්තු ඇතුළත් වේ. අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස M/s Liberty Commodities Pte Ltd වෙත දන්වමින් 2019 දී විවන ලද විද්‍යුත් තැපෑලක් (an email) අමුණා ඇත. බේරුම්කරණ ක්‍රියාවලිය මේ සම්බන්ධයෙන් සිදුවෙමින් පවතී.

1.2(ව) සඳහා පිළිතුර

ලංකා නැව් සංස්ථාව විසින් කරන ලද වැරදි ප්‍රකාශනයක් හේතුවෙන් සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම නැවිගත කිරීමේ අංක 123 සඳහා ශ්‍රී ලංකා රේගුවට රු.29,266,966 ක වැට බද්දක් වැඩිපුර ගෙවා ඇත. LCC විසින් දැනටමත් මුදල් ආපසු අය කර ගැනීමේ ඉල්ලීමක් ගොනු කර ඇති අතර ආපසු අය කර ගැනීම සම්පූර්ණ කිරීමට හෝ බක්ක හි හිඟ රේගු ශේෂයන්ට එරෙහිව හිලව් කිරීමට රේගු දෙපාර්තමේන්තුව සුදුසු විධිවිධාන මත කටයුතු කරමින් සිටී. ආපසු අය කර ගැනීමේ හිමිකම් පෑම විසඳන තෙක් බක්ක විසින් CSC හි හිඟ මුදලටසමාන මුදලක් රඳවා ගෙන ඇත.

1.2(ඒ) සඳහා පිළිතුර

ඇත්ත වශයෙන්ම, අපි 2021 දෙසැම්බර් 31 වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂයේ වෙනස සඳහා අයිතම හඳුනා ගනිමින් සැසඳුම් ප්‍රකාශනයක් සකස් කළෙමු. බොහෝ අයිතම සාධාරණ හේතු මත LCC විසින් වෙන්කරවා නොගත් අතර සටහන අංක 24 ලබැඳීම් සහ අවිනිශ්චිතතා ලයටතේ අනාවරණය කර ඇත. LCC සහ CSC දැනට 2021 දෙසැම්බර් 31 වන විට වර්ෂ අවසාන ශේෂයන් හි පවතින නොගැලපීම් සහ හඳුනා නොගත් වෙනස්කම් විසඳීමට සාකච්ඡා කරමින් සිටී.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

1.2(ඔ) සඳහා පිළිතුර

ලංකා විදුලිබල මණ්ඩලය අභ්‍යන්තර විගණන ශාඛාව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව ගෙවිය යුතු ගිණුම් (ගිණුම් කේත අංකය: 20000), 2018 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද වැරදි ගිණුම්කරණ සටහන් හේතුවෙන් සිදුවී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය අභ්‍යන්තර විගණන ශාඛාව විසින් කරන ලද නිර්දේශයන්ට අනුකූලව ඉහත දෝෂය නිවැරදි කිරීම සඳහා අපි නිවැරදි කරන ලද සටහන් සිදුකරන්නෙමු.

2.2.2 සඳහා පිළිතුර - යම් අඳාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට යොමුව

2.2.2 (අ) සඳහා පිළිතුරු, 2003 ජූනි 02 දිනැති PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය:

i. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද SORP 2021 අප්‍රේල් 03 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරන ලද අතර විදුලිබල අමාත්‍යාංශයේ ඉල්ලීම් ලිපියට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව SORP සඳහා අනුමැතිය ලබා දී ඇති අතර අධ්‍යක්ෂමණ්ඩල තීරණයට අනුව ක්‍රියා කර ඇත. (පිටපත අමුණා ඇත).

ii. 2020 ජූනි 10 වන දින පැවති 73 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව,නීතීඥයෙකු විසින් අනුමත කරන ලද ණය ඉල්ලුම්පත්‍රයක් සහ ඇපකර පත්‍රයක් සමඟින් ශේෂය අඩුකිරීමේ පදනම මත 6% ක පොලී අනුපාතයකට රු.350,000 ක උපරිම ණය පහසුකම් ලබාදීමට LCC අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය.

iii. කාර්ය මණ්ඩල අසනීප නිවාඩු සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අනුමැතිය ක්‍රියාත්මක කිරීමට 87 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම අනුමත කර ඇත. නමුත් මේ දක්වා සමාගම විසින් 2021 වර්ෂය සඳහා ප්‍රතිපාදනය කරන ලද ප්‍රයෝජනයට නොගත් කාර්ය මණ්ඩල අසනීප නිවාඩු ලෙස රු.1,916,044 ක මුදලක් ගෙවා නොමැත.

2.2.2 (ආ) සඳහා පිළිතුරු, 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය:

LCC හි වියදම් ලංවීම විසින් ප්‍රතිපූරණය කරනු ලබන බැවින් ලංකා විදුලිබල මණ්ඩලයෙන් කිසිදු විරෝධතා ලිපියක් ලබා නොගැනීමට යටත්ව ප්‍රසාද දීමනා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. තවද, මෙය ලංවීමට අමතර වියදමක් නොවන අතර 2020 වර්ෂය සඳහා ද එම ක්‍රියා පටිපාටියම අනුගමනය කර තිබේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

.....

ආචාර්ය ජගත් පෙරේරා
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ

ගිණුම්කරණ සටහන්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	10	7,624,171	10,117,801
අනෙකුත් ජංගම නොවන වත්කම්	11	775,977,718	775,977,718
		783,601,889	786,095,520
ජංගම වත්කම්			
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	12	9,916,161,928	5,717,315,684
ආපසු ගෙවන තැන්පතු	13	117,000	117,000
මූල්‍ය වත්කම්	14	-	-
කාර්යමණ්ඩල සඳහා ණය	15	2,857,068	5,053,666
ලැබිය යුතු බදු	16	29,266,966	29,271,686
බැංකුවේ තිබෙන මුදල් සහ අතැති මුදල්	17	59,278,171	8,505,432
		10,007,681,132	5,760,263,468
මුළු වත්කම්		10,791,283,021	6,546,358,988
හිමිකම් සහ වගකීම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	20,000,000	20,000,000
රඳවාගත් ඉපැයුම්		79,094,282	79,094,282
ප්‍රත්‍යාගණන සංචිත		7,875,000	7,875,000
		106,969,282	106,969,282
ජංගම නොවන වගකීම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	19	5,519,320	4,441,920
අනෙකුත් ජංගම නොවන වගකීම්	20	714,965,434	714,965,434
		720,484,754	719,407,354
ජංගම වගකීම්			
ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	21	9,954,368,490	5,711,500,524
උපචිත වියදම්	22	2,840,714	2,251,281
ගෙවිය යුතු ආදායම් බදු	23	6,619,781	6,230,547
		9,963,828,985	5,719,982,352
මුළු වගකීම්		10,684,313,739	6,439,389,706
මුළු හිමිකම් සහ වගකීම්		10,791,283,021	**6,546,358,988**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇති බව මම සහතික කරමි.

බී.ඒ.ඒ.කුමාර
මූල්‍ය කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලැබේ. අධ්‍යක්ෂමණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරමු.

අධ්‍යක්ෂකගේ නම	සභාපති/අධ්‍යක්ෂ	අත්සන
බී.කේ. ජගත් පෙරේරා	සභාපති	
	අධ්‍යක්ෂ	

2022 පෙබරවාරි 25
කොළඹ

මූල්‍ය කාර්යසාධන සහ අනිකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම	4	59,046,036,553	41,000,383,219
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)	5	(58,990,572,660)	(40,954,618,074)
දළ ලාභය		55,463,893	45,765,145
අනෙකුත් ආදායම්	6	1,016,370	1,838,455
පරිපාලන වියදම්		(60,718,556)	(53,836,714)
මෙහෙයුම්වලින් ලද ලාභය		(4,238,293)	(6,233,114)
මූල්‍ය ආදායම්	7	4,461,623	6,316,381
මූල්‍ය පිරිවැය		(223,330)	(83,267)
බදු පෙර ලාභය	8	-	-
ආදායම් බදු වියදම්	9	-	-
වර්ෂය සඳහා ලාභය		-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්		-	-

සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	රඳවාගත් ඉපැයුම් රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	එකතුව රු.
2019.01.01 දිනට ශේෂය	20,000,000	79,094,282	-	99,094,282
2019 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	-	-	
2019.12.31 දිනට ශේෂය	20,000,000	79,094,282	-	99,094,282
2020 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
මෝටර් රථ ප්‍රත්‍යාගණන කිරීමේ ලාභය/ (අලාභය)	-	-	7,875,000	7,875,000
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	-	7,875,000	7,875,000
2020.12.31 දිනට ශේෂය	20,000,000	79,094,282	7,875,000	106,969,282
2021 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	20,000,000	79,094,282	7,875,000	106,969,282

ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් සාදයි
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිත)/මුදල් ගැලීම		
ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය	-	-
පහත දැක්වෙන කාර්යයන් සඳහා ගැලපීම්		
ක්ෂය කිරීම්	1,591,273	1,820,290
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	944,817	1,258,603
මූල්‍ය ආදායම්	(6,316,381)	(2,359,475)
මූල්‍ය පිරිවැය	83,267	251,253
අනිකුත් ආදායම්	(6,705)	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**(3,703,729)**	**970,672**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්,		
වෙළඳ සහ අනිකුත් අයවිය යුතු හි (අඩුවීම්)/වැඩිවීම	(2,854,016,238)	2,399,449,578
තැන්පතුවල (අඩුවීම්)/වැඩිවීම	-	10,433
කාර්යමණ්ඩලය සඳහා ණය හි (අඩුවීම්)/වැඩිවීම	(595ළ136)	2,656,574
අත්තිකාරම් ගෙවීම්වල (අඩුවීම්)/වැඩිවීම	(2,950,508)	(312,844,959)
ණයහිමියන්ගේ අඩුවීම්/(වැඩිවීම්)	2,861,275,124	(2,168,661,823)
උපචිත වියදම්වල අඩුවීම්/(වැඩිවීම්)	(1,191,418)	(4,835,021)
මෙහෙයුම්වලින් (භාවිත)/උත්පාදනය කරන ලද මුදල්	**(1,181,905)**	**(83,254,547)**
අඩුකළා :		
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(83,267)	(251,253)
පෙර වර්ෂයේ ගැලපීම්	-	-
ගෙවන ලද පාරිතෝෂික	(452,100)	-
ගෙවන ලද ආදායම් බදු	-	(94,776)
ආදායම් බදු ගැලපීම්	185,906	442,388
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිත)/උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්	**(1,531,366)**	**(83,158,188)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම්		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම	(575,840)	(179,076)
අනිකුත් ආදායම්	6,705	-
පොලී ආදායම්	6,316,381	2,359,475
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිත) උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්	**5,747,246**	**2,180,399**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් සහ මුදල් සමාන හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	4,215,880	(80,977,790)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	4,289,552	85,267,342
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන අයිතම	**8,505,432**	**4,289,552**

මුදල් සහ මුදල් සමාන අයිතම විශ්ලේෂණය කිරීම

බැංකුවේ තිබෙන මුදල් - වාසිදායක	8,505,432	4,289,552
අත ඇති මුදල්	-	-
බැංකුවේ සහ අත ඇති මුදල්	8,505,432	4,289,552
කෙටිකාලීන ආයෝජන	-	-
	8,505,432	**4,289,552**

සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වාර්තා කරනු ලබන අස්ථිත්‍යය

1.1 ස්ථාපනය සහ නෛතික ආකෘතිය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 ජනවාරි මස 01 වෙනි දින සංස්ථාපනය කරන ලද සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පරිශ්‍රය අංක 51/3, දුටුගැමුණු මාවත, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය වෙත (LVPP) කාලසීමාව තුළ සම්පාදනය කිරීම ය. ලංකා ගල්අඟුරු සමාගම (LCC) මෙම බැඳීම සිය පැවැත්ම පුරාවට උද්යෝගීමත්ව සපුරාලමින් සිටී. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ සිට ලක්විජය ගල්අඟුරු බලාගාරයේ ජැටිය (Jetty) දක්වා ගල්අඟුරු ලබාදීම දක්වා වන සියලුම ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ලංකා ගල්අඟුරු සමාගම මගින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල්ව වර්ග කළ හැකිය:-

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ප්‍රසම්පාදන පිරිසැකසුම් කිරීම සහ ප්‍රදානය කිරීම.
2. ණයවර ලිපි විවෘත කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව සහ බැංකුකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ බැංකු පහසුකම් සහ ලිපි ලේඛන විධිමත් කිරීම.
3. ප්‍රවර්ධන, ප්‍රවාහනය සහ බත්තල් සේවා.
4. ගැනුම්කරු (LVPP) සැපයුම්කරුවන්, පර්යන්ත ක්‍රියාකරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ පාර්ශවකරුවන් අතර විවිධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය.

වර්ෂය අවසානය වනවිට සමාගමේ සාමාන්‍ය සේවක සංඛ්‍යාව 23 ක් විය.

1.3 මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සියයට 100 ක්ම රජයට අයත් අස්ථිත්වයක් වන අතර මූලික මව් කළමනාකරණ සහ පාලන පාර්ශවය වන්නේ සමාගම සංස්ථාපනය කිරීමේ සිට එහි කොටස්වලින් 60% අයත් ලංකා විදුලිබල මණ්ඩලය ය. ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපනය කරන ලද්දේ 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේය.

1.4 අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 25 වැනි දින නිකුත් කිරීමට බලය ලබා දී ඇත.

පිටු අංක 15 සිට 24 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ අනිකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන අංගවලින් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ ඒ සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කොට ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කොට ඇති අතර අවශ්‍ය පරිදි යෝග්‍ය අනාවරණය කිරීම් සපයා ඇත.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වර්ෂය තුළ අනුගමනය කරන ලද සුවිශේෂී ගිණුම් පිළිවෙත් අංක 3.1 සිට 3.14 දක්වා සටහන්වල දක්වා ඇත. අදාල SLFRSs සහ LKASs www.casrilanka.com දරණ වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ එහි දක්වා ඇති අනාවරණය කිරීම් පෙර අනුගමනය කරන ලද ඉදිරිපත් කිරීම්වලට අනුකූල වේ. ආදායම් ප්‍රකාශනය, සටහන් අංක 3.8.1 හි විස්තර කර ඇති 2017 වර්ෂයෙන් ආරම්භවී උපයෝගී කරගනු ලැබූ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියෙන් සමන්විත වේ.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශය වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

2.3 කයාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4 ප්‍රමාණාත්මකභාවය සහ සමුච්චිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත LKAS 1 ට අනුකූලව (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම), සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ ක්‍රියාවන්ද ඒවා ද්‍රව්‍යාත්මක නොවේ නම් මිසක වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීමට නීති ප්‍රකාරව බලාත්මක අයිතියක් තිබෙන විට සහ ශුද්ධ පදනම මත හිලව් කිරීමට හෝ වත්කම උපලබ්ධි කිරීමට සහ ඒ සමඟම බැරකම හිලව් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණි.

ගිණුම් ප්‍රමිතියකින් අවශ්‍ය කරනු ලබන්නේ නම් හෝ අවසර දී ඇත්නම් මිසක ආදයම් සහ වියදම් නිශ්චය කිරීමේදී ඒවා හිලව් කරනු නොලැබේ.

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනස්කම් සහ සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් අදාල කරගනු ලැබූ ගිණුම් පිළිවෙත් වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම් මිසක පෙර වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ. ආදායම සහ විකුණුම් පිරිවැය සඳහා ගිණුම් හැසිරීම 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිපත්තිය පරිදි ගැනුම්කරුවෙකුගේ සහ විකුණුම්කරුවෙකුගේ ආදායමට සහ විකුණුම් පිරිවැයට අනුකූල වේ. මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම පිණිස පෙර වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය අවස්ථාවලදී නැවත සකස් කර ඇත.

2.6 ඇස්තමේන්තු, විනිශ්චයන් සහ උපකල්පන භාවිතය

SLFRS/LKAS වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා කරන ලද වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් සහ වාර්තා කරන දිනයේදී අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල එම ඇස්තමේන්තු සහ විනිශ්චය තීරණවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පෙන්වාදී තිබෙන උපකල්පන අබණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. සංශෝධනය බලපාන්නේ එම කාල සීමාවට පමණක් නම් හෝ සංශෝධන කාල සීමාව තුළ සහ වර්තමාන සහ අනාගත කාල පරිච්ඡේද දෙකටම සංශෝධනය බලපාන්නේ නම්, ගිණුම්කරණ

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

ඇස්තමේන්තු වල සංශෝධන ඇස්තමේන්තු සංශෝධිත කාල සීමාව තුළ පිළිගනු ලැබේ.

2.7 . ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සලකා බලා සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අදාළ සටහන් වල, එනම් මූල්‍ය ප්‍රකාශන සඳහා අංක 25 සටහනෙහි සිදු කර තිබේ.

2.8 ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම්

ඇස්තමේන්තු වෙනස් කිරීම වත්කම්, වගකීම් හෝ හිමිකම්වල වෙනස්කම් ඇති කරන අවස්ථා හැර, බලපෑමට ලක් වූ කාල පරිච්ඡේදයේ (වෙනස් කිරීමේ කාල සීමාව සහ අනාගත කාල පරිච්ඡේදවල) ලාභයේ හෝ අලාභයේ බලපෑම් ඇතුළත් කිරීමෙන් අස්ථිත්වයේ අනාගත ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හඳුනා ගනී. මෙම අවස්ථාවෙහිදී, වෙනස්වන කාලපරිච්ඡේදය තුළ අදාළ වත්කම්, වගකීම් හෝ හිමිකම්වල ධාරණ අගය ගැලපීමෙන් එය හඳුනා ගැනේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මුදල් සහ සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී හෝ ශේෂ පත්‍ර දින සිට වසරක් ඇතුළත යන කාලපරිච්ඡේද දෙකෙන් වඩාත් කෙටි කාලයක් තුළ මුදල් වශයෙන් උපලබ්ධි කර ගැනීමට අපේක්ෂා කරන වත්කම් වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් එනම්, මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දින සිට වසරක කාල සීමාවකින් ඔබ්බට සමාගම තබා ගැනීමට අදහස් කරන ඒවා වේ.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ යම් සමුච්චිත අපහානයන අගය අඩු කිරීමෙන් ය. දේපළ, පිරියත සහ උපකරණයක පිරිවැය, එය මිළට ගැනීමට වැය කළ මුදල සහ එකී වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්වයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කල හැකි යම් පිරිවැයකින් සමනවිත වේ.

ස්වයං - ඉදිකළ වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, සහ වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්නයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කළ හැකි යම් වෙනත් පිරිවැය ඇතුළත් වේ. මෙයට අයිතමය ගැලවීමට සහ ඉවත් කිරීමට සහ ඒවා ස්ථානගත කරනු ලබන වැඩබිමේදී ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී දැරීමට සිදුවූ පිරිවැයද ඇතුළත් වේ.

යම් හෙයකින් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ධාරණ අගය වැඩි වන්නේ නම් එකී වැඩිවීම එකී වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවත්නා යම් බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණන සංචිත ශීර්ෂය යටතේ සෘජුවම හිමිකම්වලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, එම වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතයේ පවතින ඕනෑම බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතය යන ශීර්ෂය යටතේ අඩුවීම සෘජුවම හිමිකම්වලට හර කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගයන් ආපසු අයකර ගත නොහැකි සිදුවීම් හෝ තත්ත්වයන්ගේ වෙනස්කම් පෙන්වන විටෙකදී එකී ධාරණ අගයන් අපහායනය කිරීම සඳහා සමාලෝචනය කරනු ලැබේ.

3.2.1 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය එකී අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එකී කොටසින් මූර්තිමක් කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ ඇතිවී නම් සහ එහි පිරිවැය

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ය. ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන එකී කොටස්වල ධාරණ අගය හඳුනා නොගනු ලබන්නේ පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලවය. දේපළ, පිරියත සහ උපකරණ අලූත්වැඩියා කිරීමේ වියදිනෙදා පිරිවැය හඳුනාගනු ලබන්නේ ඒවා දැරීමට සිදුවන පරිදි ලාභය හෝ අලාභ තුළ වේ.

දේපළ, පිරියත සහ උපකරණ වෙනස් ඵලදායි ආයු කාලයක් සහිත කොටස්වලින් සමන්විත විය හැකිය. ක්ෂය කිරීම ගණනය කරනු ලබන්නේ එක් එක් තනි කොටසේ ආයු කාලය පදනම් කරගෙනය. යම් හෙයකින් එක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී වත්කමක් හඳුනා ගැනීමේ උපමානය සපුරාලන ප්‍රමාණයට අලූත් කොටස ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන කොටසේ ධාරණ අගය හඳුනාගනු නොලැබේ. අයිතමයේ ඵලදායි ආයු කාලය පුරා නියමිත කාල පරාසයන් තුළ සිදුවන ප්‍රධාන පරීක්ෂාවක හෝ ප්‍රතිසංස්කරණයක පිරිවැය එය වත්කමක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන තරමට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන කොටසේ ධාරණ අගයන් හඳුනාගනු නොලැබේ.

3.2.2 හඳුනා නොගැනීම

හඳුනා නොගැනීම යනු මූල්‍ය වත්කමක් හෝ අස්ථිත්‍යයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය බැරකම හඳුනා ගැනීම අවසන් කිරීම සඳහා භාවිතා කරන යෙදුම වේ. දේපළ, පිරියත හෝ උපකරණ අයිතම හඳුනා නොගනු ලබන්නේ ඒවා ප්‍රතිස්ථාපනය කිරීමේදී, අපහරණය කිරීමේදී හෝ ඒවා භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විටෙකදී වේ. වත්කමක් හඳුනා නොගැනීමේදී ලැබෙන යම් ආදායමක් හෝ සිදුවන අලාභයක් එකී වත්කම හඳුනා නොගනු ලබන වර්ෂයට අදාල ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ.

3.2.3 ක්ෂය කිරීම

ක්ෂය කිරීම ගණනය කරනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය මත සරල මාර්ග පදනම මත ය. මූල්‍ය කල්බදු යටතේ වන වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාලසීමාව සහ සමාන ස්ව*වත්කම්වල ඵලදායි ආයු කාලය යන දෙකින් වඩාත් කෙටි කාලය මත ය. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ. කල්බදු වැඩිදියුණු කිරීම් යටතේ පවතින වත්කම් බදු කුලී ගිවිසුම පරිදි වසර 2 ක කාලයක් තුළ ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්වන විට සහ එකී වත්කම දරන්නේ විකිණීමට හෝ හඳුනා නොගැනීමට යනුවෙන් වර්ගීකරණය කරනු ලබන දිනවලින් කලින් එළඹෙන දින නවතනු ලැබේ.

ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර ක්ෂය කරනු ලබන වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායි ආර්ථික ආයු කාලය මත ඒවායේ තක්සේරු වටිනාකම පොත්වලින් කපා ඉවත් කිරීම පිණිස සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල මාර්ග ක්‍රමයක් භාවිතා කරමිනි.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වත්කම්වල ඇස්තමේන්තුගත සළුල ආයු කාලය පහත පරිදි වේ.

වත්කම	සළුල ආයු කාලය වර්ෂ
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	5
උපකරණ	4
මෝටර් රථ	4
පරිගණක උපකරණ	4
ජාලකරණ පද්ධති	2
කල්බදු ඉඩම් වැඩිදියුණු කිරීම	2

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ වත්කම්වල ඵලදායී ආයු කාලය සහ සුන්බුන් අගය සමාලෝචනය කර අවශ්‍ය නම් සකස් කරනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනැති ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ඵලදායී ආයු කාලය වසර 4ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

3.3 මූල්‍ය කල්බදු

මූල්‍ය කල්බදු මත දේපළ, පිරියත සහ උපකරණ කල්බදු අයිතමවල හිමිකාරිත්වයට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමාගමට පැවරෙන, කල්බදු වත්කම් ලෙස වර්ගීකරණය කර දේපළ, පිරියත සහ උපකරණ යටතේ කල්බදු වත්කම් ලෙස වර්ග කරනු ලබන අතර සහ කල්බදු ආරම්භයේ දී ඒවායේ වටිනාකමට වඩා අඩු සහ අවම කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකමට සමාන මුදලක්, සමුච්චිත ක්ෂයවීම් අඩුවෙන් දක්වනු ලැබේ. ක්ෂය කිරීම සිදුකරනු ලබන්නේ කල්බදු වත්කම භාවිතා කිරීමෙන් සමාගම අපේක්ෂා කරන ප්‍රතිලාභය ලැබෙන කාලපරිච්ඡේදය මත ය.

3.4 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ අත්පත් කරගැනීමට සෘජුවම ආදේශ කළ හැකි ණය ගැනීමේ පිරිවැය හැර වත්කමින් අපේක්ෂිත ප්‍රයෝජනය හෝ විකිණීම සඳහා සූදානම් වන සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ගන්නා එකී වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන අවස්ථාවේදී යෝග්‍යතා වත්කමක් ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී ඒවා වියදම් වූ කාලපරිච්ඡේදයේදී දැරීමට සිදුවූ වියදමක් වශයෙනි.

3.5 මූල්‍ය මෙවලම් - SLFRS 09

SLFRS - 09 මගින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනා ගැනීමේ සහ මැනීම සඳහා අවශ්‍යතා නියම කරයි. IFRS 9 කලින් අදාල කරගැනීමට අවසර ඇත. සංසන්දනාත්මක තොරතුරු නැවත ලබා දීමෙන් උපකාරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංක්‍රාන්තික ප්‍රතිපාදනද සංශෝධනය කරන ලද අතර IFRS 9 වර්ගීකරණය සහ තක්සේරු ආදර්ශය වෙත ගමන් කිරීමේ බලපෑම අවබෝධ කරගැනීමට මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට සහායවීම සඳහා නව අනාවරණය කිරීම් හඳුන්වා දෙන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෘණ හානිපූරණ සහිත කලින් ගෙවීමේ විශේෂාංගවලට අදාලව සංශෝධනයක්ද ඇතුළත් කරන ලදි. මෙම සංශෝධන 2019 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන අතර, නිශ්චිත කොන්දේසියක් සපුරා ඇත්නම් - ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් වෙනුවට - ක්‍රමක්ෂය කළ පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමකින් එම සෘණ වන්දි සහිත විශේෂිත පෙර ගෙවිය යුතු මූල්‍ය වත්කම් මැනීමට සමාගම්වලට අවසර ලබාදෙයි.

මෙම ප්‍රමිතිය විසින් LKAS 39 මූල්‍ය උපකරණ ප්‍රතිස්ථාපනය කරන ලදී. ඒ අනුව, වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් ව්‍යාපාර ආකෘතිය සහ වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි පදනම් කරගෙන සියලුම මූල්‍ය වත්කම් වර්ගීකරණය කර තිබේ.

- ක්‍රමක්ෂය කරන ලද පිරිවැය
- අනිකුත් විස්තීර්ණ ආදයම් තුළින් සාධාරණ අගය (FVOCI)
- ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගය (FVTPL)

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

මූල්‍ය වත්කම්වල පසුකාලීන තක්සේරු කිරීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

කෙසේ වෙතත්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ OCI හි වෙනම රේඛීය අයිතමයකින් ඉදිරිපත් කළ යුතු මූල්‍ය වත්කම් හානිකරණයට අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම LKAS 1 සඳහා වැදගත් සංශෝධන සමාගම විසින් යොදාගෙන නොමැත.

3.5.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ ලැබිය යුතු, ණය සහ අනිකුත් ලැබිය යුතු මුදල් ඇතුළත් වේ.

